දුවේ පුතේ ....

**පහත දක්වා ඇත්තේ වාර්ෂික එක්තරා පාසලක 4 ශ්‍රේණියේ දරුවන් ගිය වාර්ෂික අධ්‍යාපන චාරිකාවක් සම්බන්ධ වාර්තාවකි.ඇත්තේ එය හොඳින් කියවන්න.**

## වාර්ෂික අධ්‍යාපන චාරිකා වාර්තාව

අප පාසලේ හතර වන ශ්‍රේණියේ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ එකසිය හතළිස් දෙනෙක් චාරිකාව සඳහා සහභාගි වූහ. අප පාසලෙන් පිටත් වූයේ පෙ.ව. 7.00ට ය. කෞතුකාගාරයට ළඟා වන විට පෙ.ව. 9.30 පමණ විය.කෞතුකාගාරයේ දී ශ්‍රී ලංකාවේ අවසාන රජු භාවිත කළ සිංහාසනය, රජුගේ ඔටුන්න හා කඩුව අපට දැකගත හැකි විය. පුරාණයේ සිට භාවිත කළ කාසි වර්ග, විවිධ කර්මාන්තවලට අදාළ උපකරණ හා මෙවලම් සුරක්ෂිත ව තැන්පත් කර තිබුණි. ප.ව.12.30 පමණ වන විට දහවල් ආහාරය ගත් අපි කෞතුකාගාරයේ සතුන්ගේ ඇට සැකිලි සුරක්ෂිත ව තබා ඇති ගොඩනැගිල්ල නැරඹුවෙමු. පුරාවිද්‍යා කැණීම්වල දී සොයා ගත් අතීත පුරාවස්තු තැන්පත් කර ඇති ආකාරය අපට දැක ගත හැකි විය. ප.ව. 2.00ට පමණ කෞතුකාගාරය නරඹා අවසන් විය. ආපසු අප පාසලට එන විට ප.ව. 4.00 පමණ විය.

ඉහත වාර්තාවේ තොරතුරු ඇසුරෙන් සකස් පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

1. චාරිකාව ගියේ කොහේට ද ? ......................................................................................
2. සහභාගි වූයේ කවුරුන් ද ?..........................................................................................
3. චාරිකාව යාමට පාසලෙන් පිටත් වූයේ කීයට ද ?...............................................................
4. එහි දී ඔබ දුටු දේ මොනවා ද ? ....................................................................................
5. පාසලට එන විට වේලාව කීය ද ?....................................................................................

- **"දුවේ පුතේ" ඔබ කුඩා කළ නිවසින් හෝ පාසලින් හෝ පෙර පාසලෙන් ගිය චාරිකාවක් මතකයට නගන්න.**
- එම චාරිකාව ගැන ඉහත ආකාරයේ කුඩා වාර්තාවක් ගොඩනගන්න.
- එම වාර්තාව අනුව පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

1. චාරිකාව ගියේ කොහේට ද ? ......................................................................................
2. සහභාගි වූයේ කවුරුන් ද ?..........................................................................................
3. චාරිකාව යාමට නිවසෙන් පිටත් වූයේ කීයට ද ?...............................................................
4. එහි දී ඔබ දුටු දේ මොනවා ද ? ....................................................................................
5. නිවස ට එන විට වේලාව කීය ද ?....................................................................................